## කවි කොළය

# පුවත්පත් කාටූන් එදා සහ අද!

හතළිස් ගණන් වල
අග හරියෙදි තරම
පාඨකයනට සිංහළ
දත් තනි කරම
**ලංකාදිපයෙන්** බිහිවුණු
අති පරම
දායාදයකි කාටූන්
දැක්මෙහි වරම

අප පොඩි දවස්වල දිනමිණ **මුද** **ලාලි**
කාටූන් ලෝකයේ බැන්දා ජය කේලි
එහි නොතිබුණද දෙස්පාලන කුණු දූලි
තිබුණා සියුම් ඉඟි රස හසරැළි කැලි

ඔසුවක් තිත්ත මැද සඟවා පැණි පූප
දෙනවා වගේ සුවකරනට අස නීප
කාටූන්කාරයා පාලක බලි රූප
නටවනු බලා වෙති සමහර අය කෝප

**කොතලාවල** මැතිඳු තේ මේසයෙ හිඳුවා
කාටූන්කාරයාටත් හරසර පිදුවා
**යූනුස්** කට කපා නවතන්නට හැදුවා
මතකයි **කොලට්** ටත් ඒ හැන්දෙන් බෙදුවා

බැලූ බැල්මෙන්ම ඇඟපත සහ ඇඳුම දිහා
කැබිනට්ටුවම ඇඳිනිය හැකි පරිදි වහා
ඔලුගෙඩි ජන්ද පෙට්ටිය තුළ තැබුව බහා
ඇන්දේ කොලට් කාටූනයකි හරිම රහා

මුලදි කොලට් ඇරඹුව ඒ ගමන එදා
**ජී. ඇස්.** අතින් සිංහළ ඌරුවද යොදා
ලංකාදීපයෙන් දෙනවිට රසය බෙදා
අවදිව බලන්නට විය සිටි පිරිස නිදා

**අමිත**ගෙ විකට විට මුව හසරැළි මැව්වා
**කරුණාදාස** හසරැල්ලට පණ පෙව්වා
ලේකක මහා **මානවසිහ** සිහ පොව්වා
කාටූන් එකට කවි කැප්ෂන් එක ලිව්වා

හොර දෙටුවනට රට කන පුප්පන ගිරිය
උහුලනු නොහැක්කේ කාටූන් වල ඉරිය
කතුවරු ලබාදෙති සහයෝගය දිරිය
පත්තරවලට කාටූන් නැතුවම බැරිය

දූෂිත පගා මරුවන් නැව් ගිලින හොරු
අල්ලා රැගෙන ගලවා වෙස්මුහුණු බොරු
කාටූන්කාරයා මැදිහත් මතය දැරු
දකුණට මෙන්ම වමටද දෙයි පහර මරු


සූකරයන්ට දෙස්පාලන ලගින මඩේ
කුණු කපුටන්ට බිජු සඟවා සිටින බඩේ
ලජ්ජා නැතිව ඔවුනට යන අයට කඩේ
කාටූන්කාරයා දෙනු ඇත තිතට වැඩේ

කාටූන් නොරිසි අය සිටියද දිය වන්නා
ජනපතිතුමෝ ජනහද රිද්මය දන්නා
කාටූන්කාරයින් සිය මැදුරට ගෙන්නා
බඩකට පිරෙන්නට හොඳ කෑමක් දුන්නා!


අරඹා මුල්පිටුව
**රන්වාහිණිය** මත
නරඹන්නන්ව යොමුකළ
කාටූනය වෙත
**බන්ධුල** කරන සේවය
ගැන අපරි මිත
කාටූන් අඳින කවුරුත්
හිසනමනු ඇත!



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka



ජන්ද කාලෙට ගමට යන ලංකාවේ දේශපාලකයා



චිත්‍රශිල්පි ඕබ්රි කොලට් 50 දශකයේ ලේක්හවුස් ආයතනයේ සිය මේසයේ ඒ සතියේ පුවත්පත්වලට කාටූන් නිමකරමින් සිටිද්දී.....

# ලංකාවට අමතක නොවන කාටූන් චිත්‍රශිල්පි - කොලට්

**කා**ටූන් චිත්‍රය පුවත්පත් කලාවට නැතුවම බැරි අංගයකි. ඒ අවශ්‍යතාව කැමරා පින්තූරය කින් පිරිමසන්නට බැරි ය. කාටූනය හිතට විදින තරමට ඒ හා ඉදිරිපත්වන ලිපියෙහි හෝ රචනාවෙහි අගය ද වඩා වැදගත්ව සිතෙහි සටහන් වෙයි.

මේ වම්පස ඇති කවිපන්ති යෙන් තලංගම ජයසිංහ කිවිඳුන් දක්වන්නේ කාටූන් චිත්‍රවල ඇති විශේෂිත වටිනාකමයි. ශ්‍රී ලංකාවේ අද සිටින ප්‍රවීනතම චිත්‍රශිල්පියා වන ඔහු අති දක්ෂ කාටූන්කරුවෙකුද වෙයි. ජීඑස්, ගෞතමදාස, කරුණාදාස, තෙන්නකෝන්, විජේසෝම, යූනුස් ආදී එකල ජනප්‍රිය චිත්‍රශිල්පීන් අතරට ලංකාවේ ඉංග්‍රීසි පුවත්පත් ඇසුරෙන් ජනතාවට අතිශය සමීප වූ ටෛම්ස් හා ලේක්හවුස් ආයතනයන්හි සේවය කළ ඔබ්රි කොලට් අමතක කළ නොහැකිය. දේශපාලන කාටූන් නිසාම කොලට් එදා අප පුවත්පත් ලෝකයේ සුවිශේෂ තැනක් හිමිකරගෙන සිටියේය.

ඒ කාලයේ කොළඹ සම්භාව්‍ය චිත්‍රශිල්පීන්ගේ කව යක් විය. එය හැඳින්වුනේ '**43 සංගමය**' යනුවෙනි. එහි කැපී පෙනෙන සාමාජිකයෙකු වූ කොළට් ද තෙල්සායම් චිත්‍රයට දක්ෂයෙකු වීය. ටෛම්ස් ආය තනයට තිබුණු කාටූන් අවශ්‍ය තාවට කොලට් මනාව ගැල පුණේය. ඔහු එකල නිර්මාණය කළ සිටිසන් පෙරේරා නම් චරිතයෙන් හැඳින්වූයේ ශ්‍රීලංකා වේ සාමාන්‍ය නාගරිකයාගේ දුක්කරදර සහ අපහසුතාවන්ය. සිටිසන් පෙරේරා කාටූනය එදා ඉංග්‍රීසි සිංහළ දෙපක්ෂයේම පාඨකයින් අතර ජනප්‍රිය විය. විජේසෝමගේ පුංචි සිඤ්ඤෝද එවැනිම චරිතයකි.

1920 සැප්තැම්බර් 5 දින කොළඹ බර්ගර් ජාතික පවුලක උපත ලත් ඕබ්රි කොලට් කොළඹ ශාන්ත පීටර් ඇතුළු පාසැල් කීපයකම ඉගෙනුම ලබා ඇත. චිත්‍රශිල්පයට ඔහු තුළ තිබූ දක්ෂතාව පාසැල් වියේ සිටම ප්‍රකට වූවකි. පින්තාරු කරණයයෙන් මිදී කාටූන් ඇඳී මට මුලින් අකමැත්තෙන් ඉදිරි පත්වූ ඔහු ශ්‍රීලංකාව සැබැවින්ම හඳුනාගත්තේ කාටූන් චිත්‍රශිල්පි යෙකු ලෙස ය. කොතලාවල, බණ්ඩාරනායක, ඩඩ්ලි, වෙල්ව නායගම් ආදී ප්‍රමුඛ දේශපාලක යින් කොලට්ගේ දෛනික උපහාසයෙන් ගැලවුණේ නැත.

1961 දී කොලට් සියපවුලේ අයත් කැටුව ලංකාව අතහැර එංගලන්තයට යන්නම යන්න ගියේය. බණ්ඩාරනායක රජය පැමිණීමත් සමග බොහෝ බර්ගර් පවුල් එසේ කළෝය. එංගලන්තයෙන් ඕස්ට්‍රේලියාවට ගිය ඔහු එහි ස්ථිරවම පදිංචි විය. දෙවරක් විවාහ වූ ඔහුට දියණියක් හා පුතෙක්ද වෙති. පියා මෙන්ම ඔව්හුද අද එ රටේ නමගිය කලාකරුවෝ වෙති.

වයස 71 ව 1992 දී කොලට් මියගියේය. ඔහුගෙන් පසු පරම් පරාව කොලට් සිහිපත් කරන් නේ කාටූන් ඔස්සේ සාමාන්‍ය ජනතාවට සමීපවන හැටි කියා-දුන් පුරෝගාමියෙකු ලෙසය.

♦ වෙනුර




**ඉරිදා**- ලංකාවෙ තවමත් කතාකරන්නෙ ක්‍රිකට් වර්ල්ඩ් **SUN** කප් එක පරාද වෙච්ච එක ගැන. කැතරින් පුංචි අම්ම කියනවා සෝමතුංග බාප්පා ඒ කණගාටුවට දවස් පහක් හයක් කිසි දෙයක් නොකා නිදාගෙනම හිටියලු. කිරිබත්ගොඩ කඩේ මුදලාලි ශෝකය පළකරන්න දවස් තුනක් කඩේ වහලා තිබුණයි කියලා කිව්වා. ඒක අහල මට හිනා ගියා. පුංචි අම්මට ඒකට ටිකක් තදවුණා. ඕගොල්ලො නම් හිනා වේවි. මේකෙ වේදනාව අපි නේ දන්නෙ කිව්වා. හැබැයි තව සුමානෙකින් කතා කරලා ඇහුවොත් පුංචි අම්මගෙන් මොකද මැච් එකට වුණේ කියලා, අහවි මොන මැච් එකද දුවේ කියලා. ඒ තමයි බාප්පලගෙ පුංචි අම්මලගෙ ක්‍රිකට්.

**සඳුදා**- මම දැක්කා ලංකාවෙ පත්තරවල ක්‍රිකට් ඔස්තාද් **MON** ලා අදහස් දක්වලා තිබුණා ඇයි අපි අවසාන වට-යට එනකල් හොඳට සෙල්ලම්කරලා අන්තිම මැච් එකේ දි කාගත්තෙ කියලා. දැන් මොන විදියට විග්‍රහ කළත් මට පේන්නෙ මේකයි. මහේල , සංගක්කාර, දිල්ශාන්, මාලිංග හොඳ ක්‍රීඩකයො බව ඇත්ත. ඒත් තරඟයක් දිනන්න ඒ කියන්නේ අවසාන තරඟයක් දිනලා කප්එක ගන්න සලස්වන තැනට වැඩ කරන්න කෙනෙක් එතන නෑ. හැබැයි අර්ජුණ රණතුංගට ඒ මැච් දිනන කුසල තාව තිබුණා. අනික් අයත් එක්ක බලන කොට අර්ජුණ ඉතා දක්ෂ පිතිකරුවෙක් නෙවෙයි. ඒත් ඔහු තරඟ දිනන්න හැකියාව ඇති ඉංග්‍රීසියෙන් කියන විදියට Match winning Captain කෙනෙක්. ඒක තමයි අර්ජුණගෙන් පස්සෙ හතර සැරයක් අවසාන තරඟයට තේරිලත් කප් එකක් උස්සන්න අනික් කැප්ටන්ලට බැරිවුණේ.

**කුජදා**- රන්ජිත්ල ඉන්න බේස් වෝටර් වල ප්ලැට් එකේ **TUE** ලොකු කාමරේ පෝලිෂ්කාර ජෝඩුවකට කුලියට දීලා තිබුණා. මුලදි රංජිත්ලා ඒ අය අනේ හරි ෂෝක් මිනිස්සුය කිය කිය හිටියට පස්සෙ උන් මහාම එපා කරපු ඇයො වෙලා. ඒ පෝලිෂ් ගෑණි සුජාතත් එක්ක දවසක් ගහගන්නත් ඇවිත්. සති තුනකින් ගෙවල් කුලී දීලත් නෑ. යන්න කිව්වම අපි යන්නෙ නෑ කිව්වලු. රන්ජිත්ල බයයි සණ්ඩුවට යන්න. සුජාතා ලංකාවට කතා කරපු වෙලාවෙ අම්මට විස්තරේ කිව්වම, අම්ම කිව්වලු ගෙදර මිරිස් කරල් ටිකක් බදින්න කියලා. ඉතිං සුජාතා ඒ විදියට දවස් දෙකක් රෑට රෑට කුස්සියෙ මිරිස් බැදලා. අර ජෝඩුව එළිවෙන කල් කහිනවා ඇහු නලු. දවසක් උදේ නැගිටලා බලනකොට පෝලිෂ් පවුල මහ රෑම බඩුත් පටවගෙන ගිහිල්ලා.

**බුදදා** - ලංකාවට මේ ළඟදී මුස්ලිම් ත්‍රස්තවාදියො බංගලා **WED** දේශයේ පන්සල් කීපයක් කඩලා ගිනිතියලා දහම් පොතපත ඇතුළු බුදුපිළිම විනාශකරලා මහා හානියක් කරලා. ඒ රටේ බෞද්ධයො ටික කරකියාගන්න දෙයක් නැතුව ඉන්නවා. එක්සත් ජාතීන්ට කිව්වා වටේට තියන රටවල් වලට කිව්වා කිසිවැඩක් වුණේ නෑ. මම දැක්කා බංගලාදේශයේ සමහර බෞද්ධ කාන්තාවො ඒ ගිනි තියපු පන්සලේ ගේට්ටුවෙ එල්ලිලා අඩනවා. මට මතක් වෙනවා අවුරුදු කීපෙකට ඉස්සෙල්ලා ඇෆ්ඝනිස්ථානෙ අච්චර අර විසාල බැමියන් බුදු පිළිමෙට තලේබාන් මුස්ලිම්කාරයො ඩයිනමයිට් දාලා පුපුරවන කොට මම අඬපු හැටි. බුදු පිළිම කඩලා විනාසකරන ලෝකෙකට මෛත්‍රිය කරුණාව මොකටද? ඒවයින් කිසි වැඩක් නෑ. මේකට විසඳුම මොකක්ද කියනඑක මට හිතාගන්න බෑ.

**ගුරුදා** - ලන්ඩන්වල අවුරුදු පහක් විතර ඉඳලා ලංකාවට **THU** ගිය සිංහල පවුලක් සීදුවෙ කැතරින් පුංචි අම්මලගෙ ගෙදරට අල්ලපු ගෙදරට ඇවිල්ලා. ඒගොල්ල ඉංග්‍රීසි යෙන් ම ලූ කතාව. දවසක් වඳුරෙක් ඒ ගෙදර වහලට පැනලා. ඒ ගෑනුකෙනා වඳුරට කියනවලු " ගෝ මංකි ගෝ බැක් ටු යුවර් ජංගල්... අනේ කියන දේ අහලා ගෝ කො...." කියලා. වඳුරා ගිහිං නෑ. ඌ වහළඋඩ ඉඳං කොහෙන්ද උස්සන් ආපු කෙහෙල් ගෙඩියක් කනවලු. ඒ පාර ඒ ගෑනුකෙනා කැතරින් පුංචි අම්මට කිව්වලු "නේබර් කැන් යූ ඩ්‍රයිව් දිස් මංකි " කියලා. පුංචි අම්ම කිව්වලු, "අනේ මට එලවන්න ලයිසන් නෑනේ " කියලා.

**කිව්දා** - මේ ගිය සතියෙ ලංකාදීප පත්තරේ පළවෙලා **FRI** තිබුණු ප්‍රවෘත්තියක්. ළඟදි ලංකාවෙ පැවැත්වුණු 20 /20 ක්‍රිකට් අවසාන තරඟයෙන් වෙස්ට් ඉන්ඩීස් පිළ ලංකාව පරද්දලා කප් එක දිනුවානේ. ඉතින් ඔය මැච් එක ටෙලි විෂන් එකෙන් බලං ඉඳපු හම්බන්තොට වඩේ වෙළෙන්-දෙක් ලංකාව පැරදිච්ච දුකට ළඟම තිබුණු තැබෑරුමට ගිහිං අරක්කු බෝතලයක් ගෙනැත්, ඒකෙන් තුන්කාලක් විතර තනියම බීලා, හොඳටම වෙරි පිට වඩේ වට්ටියත් විසිකරලා, හම්බන්තොට මූදුවෙරළට ගිහිං, දැන් ඉතින් ඉඳලා වැඩක් නෑ කිය කිය හයියෙන් කෑගගහ අඬ අඬ මූදෙ පනින්න ලෑස්තිවෙලා. දැකපු කවුද පොලීසියට පෝන් කරලා. පොලීසිය පටගාලා ඇවිත් වඩේකාරයව පොලීසියට අරං ගිහිං කූඩුවෙ දාලා. එතෙන්දි වඩේ මැන් ඕ අයි සී ට මෙහෙම කියලා තියනවා. " බුදු සර්! මාව නෙවෙයි කූඩුවෙ දාන්න ඕන, මහේලයි, මාලිංගයි දෙන්නා. උන් දෙන්නා තමයි අපිව කෑවෙ " කියලා.